# බුද්ධ ධර්මය
# 07ශ්‍රේණිය[02 වාරය]
# 10 පාඩම:
# ගුරු සිත සනසවා අකුරු උගනිමු
# සොදවා

සැකසුම:කේ.ආර්.එස්.කුලතුංග
ර/බණ්ඩාරනායක මහා විද්‍යාලය

# සිගාලෝවාද සූත්‍රය

බුදුරදුන් වහන්සේ වේළුවනාරාමයේ වැඩවසන සමයෙහි අවිචාරවත් ලෙස දිසා නමස්කාරයේ යෙදුණු සිගාලක ගෘහපති උදෙසා දේශනා කළ සේක.ගිහි විනය ඇතුළත් සූත්‍රය වන්නේද මෙම සූත්‍රයයි.



# සදිසා නමස්කාරය



සදිසා

- උඩ පැවිදි උතුමන්
- නැගෙනහිර දෙමාපියන්
- දකුණ ගුරුවරු
- යට දැසි දස්සන්
- බටහිර අඹු දරුවන්
- උතුර හිතමිතුරන්

ආචරියා දක්ඛිණා දිසා

බුදුරදුන්ගේ ගුරුවරයා ධමර්යයි. උන් වහන්සේ තුන් ලොවටම ගුරුවරයා වන නිසා තිලෝගුරු නම් වන සේක



# ගුරු සිසු සබදතා

## ගුරුවරයාගේ වගකීම් [යුතුකම්]

01.මැනවින් හික්මීම
02.මැනවින් ඉගැන්වීම
03.සියලු ශිල්ප ඉගැන්වීම
04.හිත මිතුරන්ට හදුන්වා දීම
05.රැකවරණය සැලසීම



## ශිෂ්‍යයාගේ වගකීම් [යුතුකම්]

01.දුටුවිට හුනස්නෙන් නැගිටීම
02.සියලු ඇප උපස්ථාන කිරීම
03.ලබාදෙන උපදෙස් හොදින් සවන්දී පිළිපැදීම
04.අවශ්‍ය කටයුතු සිදුකර දීම
05.හොදින් ඉගෙනීම




ගුරුසිත නොරිදවා
වේලාව නොවරදවා
බැති පෙම් උපදවා
අකුරු උගනී කුමරු සොඳවා

[කාව්‍යශේඛරය]

# ශිෂ්‍ය ආචාරධර්ම

- 01.වේලාසනින් පාසලට පැමිණීම.
- 02.පාසල්බිම පිරිසිදු කිරීම.
- 03.විනයගරුකව කටයුතු කිරීම.
- 04.ගුරුවරුන්ට ගෞරව කිරීම.
- 05.ගුරුබසට අවනතවීම හා සවන්දීම.



# ඇගයීම

01. සිගාලෝවාද සූත්‍රයේ ගුරුවරුන් උපමා කර ඇත්තේ කුමන දිශාවටද?

02. බුදුරජාණන් වහන්සේ සිගාලෝවාද සූත්‍රය දේශනා කරන ලද්දේ කාටද?

03. "ගුරුසිත නොරිදවා"ඇතුලත් කෘතිය කුමක්ද?

04. ගුරුවරයාට ගෞරව පිණිස ඔබට කළ හැකි දෑ හතරක් ලියන්න.

# පිළිතුරු

01.දකුණු දිශාව

02.සිගාලක තරුණයාට

03.කාව්‍යශේඛරය

04.විනය ගරුකව හැසිරීම.

හොඳින් ඉගෙන ගැනීම.

ගුරුබසට අවනත වීම.

උගන්වන දෑ හොඳින් අවබෝධ කර ගැනීම.